# දේවමාතා ප්‍රාර්ථනාව



ස්වාමිනි කරුණා කළ මැනව.

ක්‍රිස්තුනි කරුණා කළ මැනව.

ස්වාමිනි කරුණා කළ මැනව.

ක්‍රිස්තුනි අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව.

ක්‍රිස්තුනි අපේ ප්‍රාර්ථනා ගිවිස වදාළ මැනව.

පරමණ්ඩල වැඩ හිඳින පිතාවන දෙවියනි.

*අපට දයා කළ මැනව*

ලෝකය නිදහස් කළාවූ පුත්‍රවූ දෙවියනි,

ස්ප්‍රිතු සාන්තුවන දෙවියනි,

සුපිරිශුද්ධ ත්‍රිත්වය වූ ඒක දෙවියනි,

ශුද්ධවූ මරියනී,

*අප නිසා යාච්ඤා කළ මැනව.*

ශුද්ධවූ දේව මෑණියනි,

කන්‍යාති කන්‍යාවෙනි,

ක්‍රිස්තොත්තමයාගේ මාතාවෙනි,

**සාන්ත සභාවේ මාතාවෙනි,**

**දයාවේ මාතාවෙනි,**

වරප්‍රසාදයේ මාතාවෙනි,

**බලාපොරොත්තුවේ මාතාවෙනි,**

අති සුවිශුද්ධ වූ මාතාවෙනි,

අති වෘථවූ මාතාවෙනි,

කන්‍යාවෘත අභින්න වූ මාතාවෙනි,

කන්‍යාශුද්ධ අනූනව වූ මාතාවෙනි,

ප්‍රේමනීය වූ මාතාවෙනි,

ආශ්වර්‍යය යුක්ත වූ මාතාවෙනි,

යහපත් අනුශාසනා දායකවූ මාතාවෙනි,

ශ්‍රේෂ්ඨ ඇදුරාගේ මාතාවෙනි,

රක්ෂාධිකාරහුගේ මාතාවෙනි,

විසාරද බුධ්‍යාග්‍රවූ කන්‍යාවෙනි,

වන්දනීය වූ කන්‍යාවෙනි,



ප්‍රශංශනීය වූ කන්‍යාවෙනි,

ශක්තිධාරි වූ කන්‍යාවෙනි,

දයාබරිත වූ කන්‍යාවෙනි,

විශ්වාස පක්ෂවූ කන්‍යාවෙනි,

ධර්මනීති දර්පණෙනි,

පරමඥාන ආසනෙහි,

අපේ ආනන්ද කාරණාවෙනි,

ඥාන පාත්‍රෙනි,

අග්‍රාචාර යුක්ත වූ පාත්‍රෙනි,

අනර්ඝවූ භක්ති පාත්‍රෙනි,

දිව්‍ය අභිරහස් විෂයක පද්මයෙනි,

දාවිත් රාජේන්ද්‍ර කීලෙනි,

දන්තමය ගෝපුරෙනි,

ස්වර්ණමය මන්දිරෙනි,

වාක්ප්‍රසාද ගැබයෙනි,

පරමණ්ඩල වාසලෙනි,

උදය තාරාකාවෙනි,

රෝගීන්ගේ ආරෝග්‍යයෙනි,

පව්කාරයින්ගේ අඩක්කලමෙනි,

සංක්‍රමිකයන්ගේ සැනසීමෙනි,

වික්ෂිප්තයින්ගේ සැනසීමෙනි,

ක්‍රිස්තියානින්ගේ පිහිටෙනි,

සුරතාවයින්ගේ රාජේශ්වරිනි,

ආදිපිතුරුවන්ගේ රාජේශ්වරිනි,

දිවස්ප්‍රසාදින්ගේ රාජේශ්වරිනි,

අපෝස්තුළුවරයන්ගේ රාජේශ්වරිනි,

වේද සාක්ෂිවරයන්ගේ රාජේශ්වරිනි,

වන්දනාවාදින්ගේ රාජේශ්වරිනි,

කන්‍යාවන්ගේ රාජේශ්වරිනි,

සමස්ත ශුද්ධවන්තයන්ගේ රාජේශ්වරිනි,

ජම්ම දෝෂ රහිතව පිළිසිඳුනාවූ රාජේශ්වරිනි,

ස්වර්ගාරෝපිත රාජේශ්වරිනි,

ශුද්ධවූ ජපමාල රාජේශ්වරිනි,

සමස්ථ කුටුම්බයන්හි රාජේශ්වරිනි,

සමාදානයේ රාජේශ්වරිනි,

ලෝක පාපවල් හරින දේවාජබාලක වූ ජේසුනි,

අපට ක්ෂමා කළ මැනව ස්වාමි,

ලෝක පාපවල් හරින දේවාජබාලකවූ ජේසුනි,

අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව ස්වාමි,

ලෝක පාපවල් හරින දේවාජබාලකවූ ජේසුනි

අපට දයා කළ මැනව ස්වාමි,

ක්‍රිස්තු තුමන්ගේ වාක්දාත වලට අප හේතුවන්ත වන ලෙස,

කන්‍යා ශුද්ධවූ දේව මාතාවෙනි, අප නිසා යාච්ඤා කළ මැනව.

යාච්ඤා කරමහ

සර්වබලධාරී අනාදි අනන්තවූ දෙවියනී, මෝක්ෂම්පන්න මාතාවන කන්‍යා මරියතුමන්ගේ ගත හා ප්‍රාණය ඔබගේ ශ්‍රී කුමාරයාට ඔබින වාසස්ථානය වන ලෙස ස්ප්‍රීතු සාන්තු වරමින් හේතු යුක්ත කරදී වදාළාවේද, අප සතුටුව සිහි කරන ඕතුමන්ගේ දයාබර යාච්ඤාව බලා අපට යෙදෙන්නාවූ නපුරු වලින් හා අනවර්ත මරණයෙන් ගැළවීම සැලසුව මැනව. මේ කී දේ අප ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තු උදෙසාම ලැබේවා. ආමේන්.

ශුද්ධවූ දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා විසින්

1980, සාන්ත සභාවේ මාතාවෙනි
1995, සමස්ථ කුටුම්බයන්හි රාජේශ්වරිනි

ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා විසින් 2020

දයාවේ මාතාවෙනි,
බලාපොරොත්තුවේ මාතාවෙනි,
සංක්‍රමිකයන්ගේ සැනසීමෙනි,

